# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## ජ්‍යෙෂ්ඨ පරිසර හා සමාජ ආරක්ෂණ නිලධාරී

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (PHSEP) යනු ලෝක බැංකුව (WB) විසින් අරමුදල් සපයනු ලබන සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. අදාළ සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 150ක් වන අතර, එය නිර්මාණය කොට ඇත්තේ 2024-2028 කාලපරිච්ඡේදය තුළ , ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය කෙරෙමින්, ප්‍රාථමික සෞඛ්‍යාරක්ෂක සේවා සම්බන්ධව ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම හා ඉහළ තත්ත්වයෙන් පවත්වා ගැනීම වේ.

ඒ අනුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි (PMU) පවත්නා පහත සඳහන් තනතුර පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. එක් එක් තනතුරක් සඳහා වැටුප් ගෙවීම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2019 මාර්තු 05 දිනැතිව නිකුත් කළ අංක 01/2019 චක්‍රලේඛය ප්‍රකාරව සිදු කෙරේ.

| තනතුර | තනතුරු ගණන | වර්ගීකරණය (අංක 01/2019) චක්‍රලේඛය ප්‍රකාරව | සුදුසුකම් |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ පරිසර හා සමාජ ආරක්ෂණ නිලධාරී | 01 | PS 5 | අදාළ සුදුසුකම්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නිකුත් කළ චක්‍රලේඛ අංක 01/2019 අනුගාමීව වන අතර, එය ඇමුණුම 1 (පිටුව 1 - 26) යටතේ තිරුවෙහි ඇමරිකන් ඩොලර් මිලියන 100 හෝ සමාන මුදලක් සහ ඇමරිකන් ඩොලර් මිලියන 250 ට අඩු. |

ඉහත තනතුරට අදාළ සුදුසුකම්, පළපුරුද්ද හා වගකීම්, කුසලතා හා ප්‍රවීණත්වයන් ප්‍රධාන රාජකාරී හා පොදු කොන්දේසි ඇතුළත් විස්තරාත්මක තොරතුරු සඳහා :

- කරුණාකර ප්‍රවේශවන්න : **http://phsep.lk/ document/ess.pdf**
- අවසන් දිනය : 2025 නොවැම්බර් 24

විස්තරාත්මක ජීවදත්ත විස්තර (විශේෂ ආකෘති පත්‍රයක් නොමැත) සමග, අධ්‍යාපනික, පළපුරුද්ද හා අනෙකුත් සුදුසුකම්වල සහතිකවල පිටපත් සමග නම/ දුරකථන/ ෆැක්ස්/ඊමේල් ලිපිනය ඇතුළත්ව සකස් කළ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන් පමණක් පහත සඳහන් ලිපිනය වෙත 2025 නොවැම්බර් 24 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අදාළ ශීර්ෂය සමග "........................................ තනතුර සඳහා අයදුම්පත - ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (PHSEP)" යනුවෙන් සඳහන් කළ යුතුය.

**ලිපිනය :**

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (PHSEP) ,**
**191 ඒ, ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය, "ද බංගලෝ",**
**ධර්මපාල මාවත, කොළඹ 07.**

**වැඩිදුර විස්තර සඳහා:**

- **ඊමේල් : info@phsep.lk**
- **දුරකථනය : 0112271150**

අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද, කුසලතා හා ප්‍රවීණත්වයන් සපුරා, නොමැති මෙන්ම ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ, සහයක ලේඛන අමුණා නොමැති මෙන්ම ලියාපදිංචි තැපෑලෙන් හැර වෙනත් මාර්ගවලින් (ඊමේල් , අතින් ගෙනවිත් භාරදීම හෝ වෙනත් ලිපිනයන් වෙත යොමු කළ) එවනු ලබන අයදුම්පත් සලකා නොබලන අතර, ප්‍රතික්ෂේප කෙරේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (PHSEP).**
**2025 නොවැම්බර් 09**